සියලු ම හිමිකම් ඇව්රිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ඉන්දීය ඉතිහාසය II (II කොටස)
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

25 A | S | II

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**

※ **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නයටත්, **B** හා **C** කොටස්වලින් එක ප්‍රශ්නය බැගින් තෝරා ගෙන තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවැනි** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) රූපාර් (ii) තාම්‍රලිප්ති
(iii) බෝලාන් (iv) හින්දුකුෂ්
(v) මථුරා (vi) සත්පුර
(vii) ජුනාගාඩ් (viii) උජ්ජේනි
(ix) ප්‍රතිෂ්ඨාන් (x) තන්ජෝර්
(xi) සුප්පාරක (xii) ගෝදාවරී

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)*

## B කොටස

2. ඉන්දියානු ඉතිහාසය හැඩගැසීමේලා වයඹදිග කපොලු බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 16යි.)

3. පුරාතන ඉන්දියාවේ ආගමික විශ්වාස සහ පූජා විධි පහත දැක්වෙන තේමා යටතේ විචාරාත්මකව විග්‍රහ කරන්න.

(i) ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස හා පූජා විධි (ලකුණු 08යි.)

(ii) ඍග් වෛදික වැසියන්ගේ ආගමික විශ්වාස හා පූජා විධි (ලකුණු 08යි.)

4. "උතුරු ඉන්දියාවේ මුල් ම අධිරාජ්‍ය නිර්මාපකයෝ මෞර්යයෝ වූහ."

(i) මෞර්ය අධිරාජ්‍යයෙහි සමාරම්භකයා ලෙසට සැලකෙන්නේ කවරෙක් ද? (ලකුණු 01යි.)

(ii) මෞර්ය අධිරාජ්‍යය ගැන තොරතුරු ලබාදෙන ප්‍රධාන සාහිත්‍ය කෘති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02යි.)

(iii) මෞර්යයන්ගේ මධ්‍ය හා ප්‍රාදේශීය පරිපාලනය සැකෙවින් දක්වන්න. (ලකුණු 04යි.)

(iv) මෞර්ය අධිරාජ්‍යයේ ක්‍රමික ව්‍යාප්තිය පරීක්ෂා කරන්න. (ලකුණු 09යි.)

5. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) හරප්පා වැසියන්ගේ නගර සැලසුම්කරණය

(ii) සොළොස් මහා ජනපද

(iii) ඉන්දු-ග්‍රීකයෝ

(iv) මෞර්ය අධිරාජ්‍යයේ පරිහානිය හා බිඳවැටීම. (ලකුණු 08 × 2 = 16යි.)

[අටවැනි පිටුව බලන්න.

## C කොටස

**6.** ඉන්දියානු ඉතිහාසයෙහිලා කුෂාණ යුගයේ වැදගත්කම පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ පරීක්ෂා කරන්න.

(i) ආගම හා සාහිත්‍යය (ලකුණු 08යි.)

(ii) කලා හා ගෘහනිර්මාණ ශිල්පය (ලකුණු 08යි.)

**7.** "ගුප්ත අධිරාජ්‍ය සමය ඉන්දියානු ඉතිහාසයෙහි සම්භාව්‍ය අවධියක් ලෙස සලකනු ලැබේ."

(i) ගුප්ත යුගයේ නිල හා සාහිත්‍යමය භාෂාව කුමක් ද? (ලකුණු 01යි.)

(ii) ගුප්ත සමයේ පැවැති ප්‍රධාන හින්දු ආගමික ශාඛා **දෙක** නම් කරන්න. (ලකුණු 02යි.)

(iii) ගුප්ත සමයේ කලා ක්ෂේත්‍රයන්හි සිදුවී ඇති වර්ධනය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04යි.)

(iv) ගුප්ත අධිරාජ්‍ය සමය ඉන්දියානු ඉතිහාසයේ සම්භාව්‍යමය අවධියක් ලෙසට සැලකිය හැකි වන්නේ කවර හේතු නිසාදැයි පහදන්න. (ලකුණු 09යි.)

**8.** "හර්ෂ දක්ෂ සටන්කාමියෙකු මෙන්ම හොඳ පරිපාලකයෙක් ද විය." මෙම ප්‍රකාශය පහත සඳහන් තේමා යටතේ සාකච්ඡා කරන්න.

(i) උතුරු ඉන්දියාවේ අධිරාජ්‍යයක් පිහිටුවීම (ලකුණු 08යි.)

(ii) හර්ෂ රජුගේ සමාජ හා ආගමික කටයුතු (ලකුණු 08යි.)

**9.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) හියුංසාං

(ii) ත්‍රිකෝණ අරගලය

(iii) චෝළයන්ගේ ප්‍රාදේශීය පාලනය

(iv) පාල රාජවංශය (ලකුණු 08 × 2 = 16යි.)

* * *

Artsapi.lk